සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

| 12 | S | I |
|---|---|---|

## දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019
## Second Term Test - Grade 13 - 2019

විභාග අංකය .............................

## සාමාන්‍ය පොදු පරීක්ෂණය

කාලය පැය දෙකයි මිනිː තිහයි.

**උපදෙස්**

- ♦ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ♦ 1 සිට 60 තෙක් එක එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරාගෙන එය උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි (x) යොදා දක්වන්න.

(1). ආසියානු සංවර්ධන බැංකු මූලස්ථානය පිහිටියේ,
1. චීනයේ ය. 2. පිලීපීනයේ ය. 3. මියන්මාරයේ ය.
4. ඉන්දියාවේ ය. 5. වියට්නාමයේ ය.

(2). චන්ද්‍රයාගේ පෘථිවියට නොපෙනන අඳුරු පැත්ත ගවේෂණය සඳහා යවනු ලද මිනිසුන් රහිත අභ්‍යවකාශ යානයක් 2019.01.03 වන දින චන්ද්‍රයා මතට ගොඩ බස්වන ලදී. එම අභ්‍යවකාශ යානය යවන ලද්දේ,
1. ජපානය විසිනි. 2. රුසියාව විසිනි. 3. ඇමරිකාව එක්සත් ජනපදය විසිනි.
4. චීනය විසිනි. 5. ඕස්ට්‍රේලියාව විසිනි.

(3). පොදු රාජ්‍ය මණ්ඩලයේ වර්තමාන මහලේකම් තනතුර දරන්නේ,
1. පැට්‍රීෂියා ස්කොට්ලන්ඩ් 2. තෙරේසා මේ 3. මිෂෙල් බැචලේ
4. ජසින්ඩා ඒර්ඩර්න් 5. මේගන් මාකෙල්

(4). 2018 අන්තර්ජාතික ශ්‍රවණාබාධිත ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියේ ශූරතාවය ශ්‍රී ලංකාව විසින් අත්පත් කර ගන්නා ලදී. එම තරගාවලියේ අවසන් මහා තරගයේ දී ශ්‍රී ලංකාව තරග කරන ලද්දේ කුමන රටක ක්‍රිකට් කණ්ඩායම සමඟ ද?
1. පකිස්ථානය 2. එංගලන්තය 3. ඉන්දියාව 4. ඇෆ්ගනිස්ථානය 5. ඕස්ට්‍රේලියාව

(5). ආසියානු රටක රැකියාව කරන ශ්‍රී ලාංකිකයෙකු විසින් එම රටේදී, ගින්නට හසුව අනතුරක මුහුණ පා සිටි කාන්තාවක එම අනතුරින් බේරා ගන්නා ලදී, එම ක්‍රියාව අගය කරමින් මේ ශ්‍රී ලාංකිකයාට, එම රටේ පුරවැසිභාවය ලබාදෙන ලද අතර එසේ පුරවැසි බව ලබා ගත් ප්‍රථම විදේශිකයා බවටද ඔහු පත්විය. මෙම ශ්‍රී ලාංකිකයාට පුරවැසි භාවය ලබා දුන් රට කුමක්ද?
1. ජපානය 2. නේපාලය 3. උතුරු කොරියාව 4. දකුණු කොරියාව 5. තායිවානය

(6). වැලිගොඩ දැමීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ ගංගා හතරක ගං මෝය ආශ්‍රිත ගංගා පතුලේ ගැඹුර මුහුදු මට්ටමට වඩා පහත බැස ඇති බව වාර්තා වේ. එම ගංගා හතර දැක්වෙන පිළිතුර තෝරන්න.
1. කැළණි, කළු, ගිං, නිල්වලා 2. මහවැලි, කැලණි, කළු, වලවේ
3. කැලණි, කළු, ගිං, මහවැලි 4. නිල්වලා, මැණික්, දැදුරු, කැළණි
5. වලවේ, කළු, මැණික්, කැළණි

(7) ශ්‍රී ලංකාවේ 07 වැනි වෛද්‍ය පීඨය 2019.01.17 දින විවෘත විය. එම වෛද්‍ය පීඨය අයත්වන්නේ කවර විශ්ව විද්‍යාලයට ද?
1. අග්නිදිග 2. කැළණිය 3. සබරගමු 4. වයඹ 5. ඌව වෙල්ලස්ස

(8). ශ්‍රී ලංකාවේ වාරි පද්ධතියට අළුතින් එකතු වූ කළු ගඟ ජලාශයට යට වූ නගරය කුමක්ද?
1. ඇඹිලිපිටිය 2. තෙල්දෙණිය 3. නාවලපිටිය 4. මැණික්හින්න 5. ලග්ගල

(9). ජාත්‍යන්තර යොවුන් ඔලිම්පික් ඉතිහාසයේ ශ්‍රී ලංකාව ලද ප්‍රථම රන් පදක්කම 2018 ඔක්තෝබර් මාසයේ දී දිනා ගන්නා ලද්දේ වයඹ පළාතේ ක්‍රීඩිකාවක් විසිනි. ඇය කවුද?
1. අනූෂා කොඩිතුවක්කු 2. චමරි අතපත්තු 3. චතුරංගී ජයසූරිය
4. හයසින්ත් විජේරත්න 5. පාරමී වසන්ති

(10). මුහුදක් හරහා ඉදිවූ ලෝකයේ දිගම පාලම මෙන්ම ලෝකයේ පස්වැනි දිගම පාලම 2018 ඔක්තෝබර් මාසයේ දී විවෘත විය. එම පාලම අයත්වන රට කුමක්ද?
1. ජපානය 2. ඇමරිකා එක්සත් ජනපදය 3. ඕස්ට්‍රේලියාව 4. චීනය 5. නෝර්වේ

(11). ශ්‍රී ලංකාවේ 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ඇමති මණ්ඩලයේ සිටිය යුතු කැබිනට් ඇමතිවරු ගණන
1. 30 කි. 2. 32 කි. 3. 40 කි. 4. 45 කි. 5. 48 කි.

(12). ශ්‍රී ලංකාවේ 71 වන නිදහස් සමරු උළලේ දී ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ ඊබ්‍රහම් මොහොමඩ් සෝලේ මහතා,
1. පිලිපින ජනාධිපතිවරයා ය. 2. ඉන්දීය විදේශ අමාත්‍යවරයා ය.
3. මාලදිවයින් ජනාධිපතිවරයා ය. 4. මාලදිවයින් විදේශ අමාත්‍යවරයා ය.
5. පිලිපීන විදේශ අමාත්‍යවරයා ය.

(13). පිලිපීනයේ පිහිටා ඇති ජාත්‍යන්තර පර්යේෂණ ආයතනය වන්නේ,
1. අන්තර් ජාතික තේ පර්යේෂණ ආයතනය 2. අන්තර් ජාතික සහල් පර්යේෂණ ආයතනය
3. අන්තර් ජාතික රබර් පර්යේෂණ ආයතනය 4. අන්තර් ජාතික තිරිඟු පර්යේෂණ ආයතනය
5. අන්තර් ජාතික කෝපි පර්යේෂණ ආයතනය

(14). එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදා සේවයේ යෙදී සිටි ශ්‍රී ලාංකික හමුදා සෙබළුන් දෙදෙනෙකු 2019 ජනවාරි මාසයේ දී ත්‍රස්තවාදී ප්‍රහාරයකින් සිදුවීම වූයේ කුමන රටකදී ද?
1. හයිටි 2. සෝමාලියාව 3. හවායි 4. මාලි 5. තුර්කිය

(15). මහරගම අපේක්ෂා රෝහල මගින් ප්‍රතිකාර කෙරෙන්නේ කුමන රෝග සඳහා ද?
1. හෘද රෝග 2. පිළිකා රෝග 3. බෝවන රෝග 4. මානසික රෝග 5. නිදන්ගත රෝග

(16). සුමිත් ළඟ යම් මුදලක් තිබුණි. ඔහු එයින් හරි අඩක් වියදම් කළ පසු නැවත ඔහුට රු. 20ක් ලැබුණි. ඉන්පසු එයින් රු. 15 ක් වියදම් කළවිට ඔහු ළඟ ඉතිරි මුදල රු. 40 කි. ඔහු ළඟ මුලින් තිබූ මුදල කීයද?
1. රු. 65 2. රු. 70 3. රු. 75 4. රු. 80 5. රු. 85

(17). ශිෂ්‍යයන් 06 දෙනෙකු ගණිතය විෂයට ලබාගත් ලකුණුවල මධ්‍යනය 54 කි. තවත් ශිෂ්‍යයන් දෙදෙනෙකු ලබාගත් මධ්‍යනය ලකුණ 62 කි. ශිෂ්‍යයන් 08 දෙනාගේ ම මධ්‍යන්‍යය ලකුණු කීයද?
1. 52 2. 54 3. 56 4. 58 5. 60

(18). A, B, C තිදෙනා ළඟ රු. 05 කාසි 19 ක් ඇත. B ළඟ ඇති කාසි ගණන A ළඟ ඇති කාසි ගණන මෙන් තුන් ගුණයකි. A ළඟ ඇති කාසි ගණනා C ළඟ ඇති කාසි ගණනට වඩා වැඩිය. B ළඟ ඇති මුදල කීයද?
1. රු. 50 2. රු. 55 3. රු. 60 4. රු. 65 5. රු. 70

- **ප්‍රශ්න අංක 19 සිට 21 තෙක් පහත විස්තර මත පදනම් වේ.**
  **P, Q, R, S, T, යන පස් දෙනා පෝලිමක සිටිති. S සිටින්නේ Q ට ඉදිරියෙනි. P ට පිටුපසින් සිටින, Rට පිටුපසින් S සිටී. T සිටින්නේ S ට පිටුපසින් හා Q ට ඉදිරියෙනි.**

(19). පෝලිමේ පිටුපසම සිටිනේ කවුද?
1. P 2. Q 3. R 4. S 5. T

(20). පෝලිමේ ඉදිරියෙන් ම සිටින්නේ කවුද?
1. P 2. Q 3. R 4. S 5. T

(21). මේ පස්දෙනා අතරින් හරිමැද සිටින්නේ කවුද?
1. P 2. Q 3. R 4. S 5. T

(22). කෑම වර්ගයක් සකස් කිරීමට සඳහා පිටි, සීනි, මාගරින් මිශ්‍ර කරනු ලබන්නේ, 3 : 2 : 1 අනුපාතයටයි. මෙම කෑම වර්ගයෙන් 3 Kg ක් සකස් කිරීමට අවශ්‍ය පිටි ප්‍රමාණය කොපමණද?
1. 1 Kg 2. 1.5 Kg 3. 1.8 Kg 4. 2 Kg 5. 2.5 Kg

(23). සුජිත් P සිට Q වෙත ගොස් එතැන් සිට R වෙත පැමිණේ. අමිල P සිට R වෙත සෘජු මාර්ගය දිගේ ගමන් කරයි. අමිල සුජිත්ට වඩා කොපමණ දුරක් අඩුවෙන් ගමන් කර ඇද්ද?




1. 3 Km
2. 4 Km
3. 5 Km
4. 6 Km
5. 7 Km

(24). ○○○ = □□□□□□ සහ □□ = △△△△ වේ. ○○ තුල්‍ය වන්නේ △ කීයකට ද?

1. 2 2. 3 3. 4 4. 6 5. 8

- **25 සිට 28 තෙක් ප්‍රශ්න පහත ප්‍රකාශ මත පදනම් වේ.**

**A, B, C, D, E පූර්ණ සංඛ්‍යා 5 කි. $\sqrt{C} = A$ ද A + D = B ද E = 4D ද A + B = E ද වේ.**

(25). A හි අගය කීයද?
1. 4 2. 6 3. 10 4. 16 5. 36

(26). B හි අගය කීයද?
1. 4 2. 6 3. 10 4. 16 5. 36

(27). C හි අගය කීයද?
1. 4 2. 6 3. 10 4. 16 5. 36

(28). D හි අගය කීයද?
1. 4 2. 6 3. 10 4. 16 5. 36

(29). මෙම තිත් රටාව අනුව 10 වෙනි රටාවේ තිබිය හැකි තිත් ගණන කීයද?



1. 40 2. 45 3. 50
4. 55 5. 60

(30). ABCD සෘජුකෝණයේ දිග 9 cm ද පළල 4 cm ද, වේ. PQRS සමචතුරස්‍රයේ වර්ගඵලය ABCD හි වර්ගඵලයට සමාන වේ. PQRS හි පරිමිතිය කීයද?
1. $20\ cm$ 2. $24\ cm$ 3. $26\ cm$ 4. $28\ cm$ 5. $30\ cm$

- **31 හා 32 ප්‍රශ්න පහත දුර කාල ප්‍රස්තාරය මත පදනම් වේ.**

**මිනිසෙක් නිවසේ සිට නගරයට පයින් ගමන් කිරීමේදී ගමන් කළ දුර හා කාලය සම්බන්ධව ප්‍රස්තාරයෙන් නිරූපණය වේ.**

(31 මුල් පැය දෙකේ දී ඔහුගේ වේගය පැයට කිලෝමීටර් වලින් සොයන්න.




1. 2 2. 3 3. 4 4. 6 5. 8

(32). ඔහු නතර වී සිටි කාලය පැය කීයද?
1. $\frac{1}{2}$ 2. 1 3. 2 4. 3 5. 4

- 33 හා 34 ප්‍රශ්න මැජික් කොටුව මත පදනම් වේ.

  **5 සිට 20 තෙක් සංඛ්‍යා එක් වරක් පමණක් යොදාගෙන ඇත. එහි සෑම පේළියක ම තීරයකම සංඛ්‍යා එකතුව නියත වේ.**

(33).

| | | | |
|---|---|---|---|
| 20 | | | 17 |
| 9 | 15 | A | |
| | | 10 | 16 |
| 8 | B | | C |

A හි අගය කීයද?
1. 12 2. 13 3. 14 4. 18 5. 19

(34). B + C හි අගය කීයද?
1. 20 2. 21 3. 22 4. 23 5. 24

(35). මිනිසෙක් පා පැදියකින් පළමු පැය 2, $10\ Kmh^{-1}$ ක වේගයෙන් ගමන් කරයි. ඉන්පසු ඔහු පාපැදියේ වේගය $8\ Kmh^{-1}$ තෙක් අඩු කර ගනී. ඔහු $40\ Km$ ක දුරක් ගමන් කළේ නම් ඔහුට ගත වූ කාලය සොයන්න.
1. පැය $3\frac{1}{2}$ 2. පැය 04 3. පැය $4\frac{1}{2}$ 4. පැය 5 5. පැය $5\frac{1}{2}$

- 36 හා 37 ප්‍රශ්න පහත විස්තරය මත පදනම් වේ.

  **ලී වලින් සකස් කරන ලද ඝනකයක් සහ එහි මුහුණතකට සර්වසම පතුලක් සහිත පිරමීඩ දෙකක් එකට අලවා ඝන වස්තුවක් සකස් කර ඇත.**

(36). එම ඝන වස්තුවේ දාර ගණන කීයද?
1. 12 2. 16 3. 18 4. 20 5. 26

(37). එම ඝන වස්තුවේ ශීර්ෂ ගණන කීයද?
1. 8 2. 10 3. 12 4. 14 5. 16

(38). පෙට්ටියක වෙරළු ගෙඩි 80 ත් 100 ත් අතර ගණනක් තිබේ. පන්තියක ශිෂ්‍යයන් අතර එම වෙරළු ගෙඩි 03 බැගින් බෙදූ විට දෙකක් ඉතිරි වේ. 04 බැගින් බෙදූවිට 01 ක් ඉතිරි වේ. පෙට්ටියේ තිබූ වෙරළු ගෙඩි ගණන කීයද?
1. 87 2. 88 3. 89 4. 90 5. 91

(39). මිනිසුන් 08 දෙනෙකුට දිනකට පැය 06 බැගින් වැඩ කර දින 04 කදී යම් කාර්යයක් නිම කළ හැකිය. දිනකට පැය 08 බැගින් වැඩ කරන මිනිසුන් 08 දෙනෙකුට එම කාර්යය නිම කිරීමට ගත වන දින ගණන කීයද?
1. 3 2. 4 3. 5 4. 6 5. 7

(40). ඝනකයක මුළු පෘෂ්ඨ වර්ගඵලය $150cm^2$ කි. එම ඝනකයේ දාර සියල්ලෙහි ම දිගෙහි එකතුව කොපමණද?
(1). 30 cm (2). 40 cm (3). 50 cm (4). 60 cm (5). 70 cm

(41). මෙහි දැක්වෙන රූපයේ ත්‍රිකෝණ කීයක් තිබේද?
1. 23 2. 25 3. 27
4. 29 5. 32



- අංක 42, 43 සහ 44 ප්‍රශ්න පදනම් වන්නේ පහත දැක්වෙන රූප සටහන මතය.

**2010 වර්ෂයේ දී මූල්‍ය ආයතනයක විවිධ වර්ගවල ලැබීම් පහත දැක්වේ.**




එකතුව = ඩොලර් මිලියන 60

(42) බැංකුවේ ලැබීම් වලින් ආසන්න වශයෙන් කොපමණ ප්‍රමාණයක් කල්බදු පොලී වශයෙන් ලැබුනේ ද?

1. ඩොලර් මිලියන 12
2. ඩොලර් මිලියන 14
3. ඩොලර් මිලියන 15
4. ඩොලර් මිලියන 17
5. ඩොලර් මිලියන 19

(43). බැංකුවේ ලැබීම් වලින් ආසන්න වශයෙන් කොපමණ ප්‍රමාණයක් තැන්පතු වශයෙන් ලැබුනේ ද?

1. ඩොලර් මිලියන 10
2. ඩොලර් මිලියන 13
3. ඩොලර් මිලියන 14
4. ඩොලර් මිලියන 16
5. ඩොලර් මිලියන 18

(44). අදාළ වර්ෂයේ දී මෙම බැංකුව පොලී වශයෙන් සහ තැන්පතු වශයෙන් ලද ලැබීම් වල වෙනස ආසන්න වශයෙන් කොපමණද?

1. ඩොලර් මිලියන 20
2. ඩොලර් මිලියන 25
3. ඩොලර් මිලියන 30
4. ඩොලර් මිලියන 35
5. ඩොලර් මිලියන 38

- **අංක 45, 46, හා 47 ප්‍රශ්න පහත දැක්වෙන රූප සටහන මත පදනම් වී ඇත. පවුලක විවිධ වර්ගවල වියදම් පහත දක්වා ඇත.**




එකතුව = ඩොලර් 60

(45). පහත සඳහන් කුමන වියදම් ප්‍රභේදය අනෙක් සියලු වියදම් ප්‍රභේදවල සාමාන්‍ය අගයට ආසන්න වශයෙන් සමානද?

1. සහල්
2. වෙනත්
3. සෞඛ්‍ය
4. අධ්‍යාපනය
5. ප්‍රවාහනය

(46). පවුලේ වියදමෙන් ආසන්න වශයෙන් කොපමණ ප්‍රමාණයක් අධ්‍යාපනය සඳහා වැය වේද?
1. ඩොලර් 6  2. ඩොලර් 7  3. ඩොලර් 9  4. ඩොලර් 10  5. ඩොලර් 12

(47). මෙම පවුලේ මාසික සෞඛ්‍ය වියදම සහ ප්‍රවාහන වියදම අතර වෙසන ආසන්න වශයෙන් කොපමණද?
1. ඩොලර් 2  2. ඩොලර් 3  3. ඩොලර් 5  4. ඩොලර් 6  5. ඩොලර් 12

- **ප්‍රශ්න අංක 48, 49, 50 පහත රූප සටහනේ දක්වා ඇති පරිදි කුඩා ඝණක 64 කින් සමන්විත වූ විශාල ඝණකය මත පදනම් වී ඇත.**



මෙම විශාල ඝණකයේ එකිනෙකට ප්‍රතිවිරුද්ධ මුහුණත් දෙකක සුදු වර්ණය ද අනෙක් මුහුණත් හතරේ රතු වර්ණය ද ආලේප කර කුඩා ඝණක 64 ට වෙන් කරන ලද්දේ නම්,

(48). සුදු සහ රතු වර්ණ දෙකම ආලේප වී තිබූ කුඩා ඝණක සංඛ්‍යාව කොපමණද?
1. 8  2. 16  3. 24  4. 28  5. 32

(49). මුහුණත් දෙකක රතු වර්ණය ආලේප වී තිබූ කුඩා ඝණක සංඛ්‍යාව කොපමණද?
1. 4  2. 8  3. 16  4. 24  5. 28

(50). මුහුණත් තුනක පමණක් වර්ණ ආලේප වී තිබූ කුඩා ඝණක සංඛ්‍යාව කොපමණද?
1. 6  2. 8  3. 12  4. 16  5. 18

(51). ප්‍රකාශ තුනකින් සමන්විත කෙටි ඡේද පහක් පහතින් දී ඇත. ඒවා අතුරෙන්, සිදුවීම්වල වඩාත් පිළිගත හැකි අනුක්‍රමය සහිත ඡේදය තෝරන්න.
1. දමිත් ක්‍රිකට් ක්‍රීඩාවට කැමැත්තක් දක්වයි. දමිත් පාසල් ක්‍රිකට් කණ්ඩායමේ සාමාජිකයෙකි. දමිත්ගේ යාහළුවා වන සුගත් පාපන්දු ක්‍රීඩකයෙකි.
2. දුර්ලභ මල් වර්ග ඉහළ මිලකට අලෙවි වේ. රජය මල් වගා කරන්නන්ට ණය පහසුකම් ලබාදේ. මල් වැවීම ස්වයං රැකියාවක් ලෙස ව්‍යාප්ත වී ඇත.
3. ජංගම දුරකතනය ප්‍රයෝජනවත් උපකරණයකි. විවිධ වර්ගවල ජංගම දුරකතන වෙළඳපළෙහි ඇත. රජයේ කාර්යාලයන්හි ස්ථාවර දුරකතන භාවිතා කෙරේ.
4. වී වගාව සඳහා කෘෂි රසායන බහුලව භාවිතා කෙරේ. රජරට ප්‍රදේශයේ වකුගඩු රෝගය ව්‍යාප්ත වෙමින් පවතී. රජය විසින් සහල් ආනයනය සීමා කර ඇත.
5. සූර්ය ශක්තිය මගින් විදුලිය නිපදවිය හැක. ශ්‍රී ලංකාවට වසර පුරාම හොඳින් සූර්යාලෝකය ලැබේ. ප්‍රමාණවත් වර්ෂාපතනයක් නොමැති විට ජල විදුලිය නිපදවීමට දුෂ්කර වේ.

1. 1  2. 2  3. 3  4. 4  5. 5

- **අංක 52 53 ප්‍රශ්නවල අනුපිළිවෙළක් නැති ප්‍රකාශ තුනක් ඇතුළත් කුඩා ඡේද පහක් බැගින් දැක්වේ. නැවත පිළිවෙළට සකස් කළ පසු සිදුවීම් අනුපිළිවෙලින් දැක්වෙන ඡේදය තෝරන්න.**

1. සජිත් දක්ෂ පාපන්දු ක්‍රීඩකයෙකි. සජිත් විදේශ සංචාරයක් බලාපොරොත්තුවෙන් සිටියි. සජිත්ගේ පියා ක්‍රීඩා පුහුණුකරුවෙකු ලෙස සේවය කරයි.
2. දසුන් පාසල් වේලාවෙන් පසු අතිරේක පන්ති සඳහා සහභාගී වේ. දසුන් තම පියා සමඟ මෝටර් රථයෙන් පාසලට යයි. දසුන්ගේ සොහොයුරිය ගුරුවරියකි.
3. නිමාලි සතුටින් සිටියි. නිමාලි අ.පෙ.ස. (උ.පෙළ) විභාගය සමත් වී ඇත. නිමාලිගේ මව මේ බව දුරකතනයෙන් ඇයට දැනුම් දුන්නා ය.
4. සහන් අසතුටින් සිටියි. සහන්ගේ සහෝදරයා නව පාසලකට ඇතුලත් කර ඇත. සහන්ගේ යහළුවා පාසලට පැමිණ නැත.
5. ප්‍රියානිගේ මව අසනීප වී ඇත. ප්‍රියානි මෙවර අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිටියි. ප්‍රියානිගේ මවගේ සහෝදරිය ඇයගේ නිවසට පැමිණෙයි.

1. 1  2. 2  3. 3  4. 4  5. 5

(53). 1. වියළි කලාපයේ වී වගාව සඳහා වැසි ජලය ප්‍රමාණවත් නොවේ. පාරම්පරික වී වර්ග වගා කිරීම කිරීම සඳහා ගොවීහු කැමැත්තක් දක්වති. වැව් ජලයට කෘෂි රසායන ද්‍රව්‍ය එකතු වී ඇත.

2. ලෝක වෙළඳපෙළෙහි කිරිපිටි මිල ඉහළ ගොස් ඇත. නීති විරෝධි ලෙස ගවයින් ප්‍රවාහණය කරණු ලැබීම අඩුවී ඇත. ශ්‍රී ලාංකිකයෝ වැඩි දෙනෙක් කිරි පිටි භාවිතා කරයි.

3. ශාරීරික නිරෝගීබව සඳහා ක්‍රීඩාව අත්‍යවශ්‍ය වේ. පාසල් සිසුන්ට ක්‍රීඩා සඳහා ප්‍රමාණවත් කාලයක් නොලැබේ. ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ජාත්‍යන්තර තරඟ සඳහා අවස්ථාව සැලසේ.

4. මාර්ග අනතුරුවැලින් මියයන සංඛ්‍යාව වැඩි වී ඇත. රජය විසින් වාහන ආනයන තීරුබදු ඉහළ දමා ඇත. මාර්ග නීති කඩ කඩකරන රියදුරන්ට විරුද්ධව නඩු පවරනු ලැබේ. වෙළඳපළේ සහල් මිළ වැඩි වී ඇත. ශ්‍රී ලංකාවේ සමස්ත ආනයන වියදම වැඩිවෙමින් පවතී,

5. ශ්‍රී ලංකාවේ තිරිඟු පිටි පරිභෝජනය ඉහළ ගොස් ඇත. වෙළඳපලේ සහල් මිළ වැඩි වී ඇත. ශ්‍රී ලංකාවේ සමස්ත ආනයන වියදම වැඩිවෙමින් පවතී.

1. 1    2. 2    3. 3    4. 4    5. 5

- අංක 54 සහ 55 ප්‍රශ්න පහත දැක්වෙන තොරතුරු පත පදනම් වේ.

**කාර්යාලයක ගිණුම ලිපිකරුවන් 06 දෙනෙක් සහ ගිණුම් ලිපිකාරිනියන් 05 දෙනෙක් සේවය කරති. ලිපිකරුවන්ගේ නම් අරුණ, සමන්, රුවන්, ප්‍රියාන්, ජගත්, සහ පමිල වේ. ලිපිකාරිනියන්ගේ නම් සකුනි, අමිලා, විපුලී, තරුෂි හා සුබෝධා වේ. මේ පිරිසෙන් 06 පමණක් ගිණුම් අංගයෙහි සේවය සඳහා යොදවා ගැනීමට තීරණය වී ඇත. එම 06 දෙනා තෝරා ගැනීමේ දී පහතින් දැක්වෙන කොන්දේසි සැලකිල්ලට ගත යුතුය.**

- අරුණ සහ ප්‍රියාන් එකට වැඩ කිරීමට කැමති ය.
- තරුෂි සමඟ වැඩ කිරීමට රුවන් කැමති නැත
- තරුෂි සහ සුබෝදා එකට වැඩ කිරීමට කැමතිය.
- ජගත් සමඟ එකට වැඩ කිරීමට සමන් කැමති නැත.
- සකුනි සමඟ එකට වැඩ කිරීමට ප්‍රියාන් කැමති නැත.
- සමන් සහ විපුලි එකට වැඩ කිරීමට කැමති ය.
- රුවන් සහ අමිලා එකට වැඩ කිරීමට කැමති ය.

(54) හය දෙනාගේ කණ්ඩායමට අරුණ, රුවන්, ප්‍රියාන් සහ පමිල යන ලිපිකරුවන් හතර දෙනා ඇතුළත් කරනු ලැබුවහොත් කණ්ඩායමට ඇතුළත් කළ හැකි ලිපිකාරිනියන් දෙදෙනා කවුද?

1. සකුනි සහ අමිලා    2. අමිලා සහ විපුලි    3. විපුලි සහ තරුෂි
4. තරුෂි සහ අමිලා    5. සුබෝධා සහ තරුෂි

1. 1    2. 2    3. 3    4. 4    5. 5

(55) සකුනි සමඟ ලිපිකාරිනියන් තිදෙනෙකු කණ්ඩායමට ඇතුළත් කරන ලද්දේ නම් කණ්ඩායමකට ඇතුලත් කළ හැකි අනෙක් සාමාජිකයන් කවුරුන්ද?

1. සමන්, රුවන්, පමිල, අමිලා හා විපුලි    2. අරුණ, ප්‍රියාන්, ජගත්, තරුෂි හා සුබෝධා
3. අරුණ, ප්‍රියාන්, සමන්, තරුෂි හා සුබෝධා    4. සමන්, පමිල, විපුලි, තරුෂි හා සුබෝධා
5. සමන්, ප්‍රියාන්, පමිල, අමිලා හා විපුලි

1. 1    2. 2    3. 3    4. 4    5. 5

- අංක 56 - 57 ප්‍රශ්න පහත ඡේදය මත පදනම් වී ඇත.

**පුරෝකථනයන්ට අනුව 2030 වර්ෂයේදී අපේ රටේ ජනගහනයෙන් සෑම පස් දෙනෙකුගෙන් එක් අයෙකුම වයස අවුරුදු 60 ඉක්මවූවකු වනු ඇත. මේ ජනගහනය පරිවර්තනයට අනුව ආසියාවේ වැඩියෙන්ම මහළු වන ජනගහනයක් ඇති රට බවට පත්වන්නේ ශ්‍රී ලංකාවයි. රටක ජනගහනයේ සුවසෙත වෙනුවෙන් එම රට සිදුකරන කැපවීම ඉහළ යන තරමටම මේ ආකාරයෙන් 'වෘද්ධ ජනගහනය' වැඩිවෙයි. මේ නිසා අමතර ගැටළු පැන නැගුනත්, සැබවින්ම එය දියුණු සෞඛ්‍ය සේවාවක ලක්ෂණයක්ම වන්නේ ය. ප්‍රායෝගිකවම අපේ රටේ සෞඛ්‍ය සේවාව ප්‍රවර්ධනයට ලක්ව ඇති බවත් ගුණාත්මකව ඉහළ මට්ටමකට පැමිණ ඇති බවටත් මේ ජනගහන පරිවර්තනයම සාක්ෂි සපයයි.**

(56) ඉහත ඡේදයෙහි ඍජුවම ප්‍රකාශ නොවන අදහස කුමක් ද?

1. ශ්‍රී ලංකාව අනාගතයේ දී වැඩිහිටි ජනගහනය වැඩි රටක් බවට පත්වේ.
2. සෞඛ්‍ය පහසුකම් වැඩිවන විට ආයුකාලය දීර්ඝ වේ.
3. වෘද්ධ ජනගහනය වැඩිවන විට විවිධ ගැටළු මතුවිය ඇත.
4. ආසියාවේ දියුණුම සෞඛ්‍ය සේවාව පවතින්නේ ශ්‍රී ලංකාවේ ය.
5. වෘද්ධ ජනගහනය වැඩිවීම ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවාවේ දියුණුව පෙන්වන එක් සාධකයකි.

1. 1    2. 2    3. 3    4. 4    5. 5

(57). ඉහත ඡේදයෙන් සෘජුවම ප්‍රකාශ වන අදහස කුමක්ද?

1. වයස අවුරුදු 60 ට ඉක්ම වූවන්ට සෞඛ්‍ය පහසුකම් සැපයීම ගැටළුවකි.
2. 2030 ක් පසු වෘද්ධ ජනගහනය නිසා ශ්‍රී ලංකාවේ ආර්ථික ගැටළු ඇතිවේ.
3. අනාගතයේ දී ශ්‍රී ලංකාවේ රෝහල් සංඛ්‍යාව වැඩි කිරීමට සිදුවේ.
4. වෘද්ධ ජනගහනය නඩත්තු කිරීමට කැපකිරීම් කළයුතුය.
5. සෞඛ්‍ය සේවාව දියුණු හා ව්‍යාප්ත වීම වෘද්ධ ජනගහනය වැඩිවීමට හේතු වේ.

1. 1 2. 2 3. 3 4. 4 5. 5

- **අංක 58 - 59 යන ප්‍රශ්න එක් එක් ප්‍රශ්නයෙහි A සිට F තෙක් නම් කරන ලද ප්‍රකාශ හය බැගින් දී ඇත. ඒවායින් තුනක් කාලානුරූප අනුපිළිවෙළකට සංවිධානය කළ හැකිය. එම ප්‍රකාශ තුන කාලානුරූප අනුපිළිවෙලින් දැක්වෙන අක්ෂර අඩංගු වරණය තෝරන්න.**

(58).

A. සිතාරා පුහුණු ගුරුවරියකි.
B. සිතාරා නිරන්තරයෙන් සංගීත පුහුණුවීම්වල යෙදෙති
C. සිතාරා සංගීත විශාරදවරියකි.
D. සිතාරා පාසලේ බටහිර සංගීත උගන්වයි.
E. සිතාරා සංගීතයට කැමතියි
F. සිතාරාගේ මිතුරිය වන සුලානි ද සංගීතයට කැමතියි.

1. ABC 2. ADE 3. EBC 4. AEF 5. BEF

(59).

A. අතුල ව්‍යාපාරිකයෙකි.
B. අතුලගේ පියා විදේශ රැකියාවක නිරත වෙයි.
C. පියල් අතුල සමග බැඩ්මින්ටන් ක්‍රීඩා කරයි.
D. අතුලගේ දරුවෝ සමහරවිට ඔවුන් සමඟ බැඩ්මින්ටන් ක්‍රීඩා කරති.
E. පියල් ඉරිදා දිනවල සවස් කාලයේ අතුලගේ නිවසට යයි.
F. අතුලගේ භාර්යාව ගුරුවරියකි.

1. BFA 2. ECD 3. AFB 4. CDE 5. FBA

(60). පහත දැක්වෙන ගණකය දිග හැරීමෙන් පසු දැක්වෙන හැඩය පෙන්වන පිළිතුර තෝරන්න.





1. 1 2. 2 3. 3 4. 4 5. 5

**සාමාන්‍ය පොදු පරීක්ෂණය - 2019**
**பொதுச் சாதாரண பரீட்சை – 2019**
**දෙවන වාර පරීක්ෂණය -2019 இரண்டாந் தவணைப் பரீட்சை – 2019**
**13 ශ්‍රේණිය - தரம் 13**
**පිළිතුරු - விடைகள்**

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (1) | 2 | (11) | 1 | (21) | 4 | (31) | 2 | (41) | 5 | (51) | 2 |
| (2) | 4 | (12) | 3 | (22) | 2 | (32) | 3 | (42) | 1 | (52) | 3 |
| (3) | 1 | (13) | 2 | (23) | 4 | (33) | 3 | (43) | 2 | (53) | 5 |
| (4) | 3 | (14) | 4 | (24) | 5 | (34) | 4 | (44) | 4 | (54) | 2 |
| (5) | 4 | (15) | 2 | (25) | 2 | (35) | 3 | (45) | 3 | (55) | 1 |
| (6) | 1 | (16) | 2 | (26) | 3 | (36) | 4 | (46) | 2 | (56) | 4 |
| (7) | 3 | (17) | 3 | (27) | 5 | (37) | 2 | (47) | 1 | (57) | 5 |
| (8) | 5 | (18) | 3 | (28) | 1 | (38) | 3 | (48) | 5 | (58) | 3 |
| (9) | 5 | (19) | 2 | (29) | 4 | (39) | 1 | (49) | 3 | (59) | 2 |
| (10) | 4 | (20) | 1 | (30) | 2 | (40) | 4 | (50) | 2 | (60) | 2 |